ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

**පුවත්පත් නිවේදනය**

**මහ කොමසාරිස්තුමා ගරු කතානායකතුමා හමු වේ**

2021 පෙබරවාරි 17 වන දින ඉන්දීය මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මැතිතුමා ගරු කතානායක මහින්ද යාපා අබේවර්ධන මැතිතුමාව එතුමාගේ නිවසේදී හමු විය. කතානායකතුමා ට සිය සුබපැතුම් එක්කළ මහ කොමසාරිස්තුමා කොවිඩ්-19 වසංගතයට එරෙහිව ශ්‍රී ලංකාව විසින් ගන්නා ප්‍රයත්නයන් අගය කළේය . ශ්‍රී ලංකාවේ එන්නත්කරණ වැඩසටහන සාර්ථක අයුරින් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ප්‍රශංසනාත්මකව අදහස් දැක්වූ එතුමා මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට සහය දැක්වීමේදී ඉන්දියාව වැදගත් කාර්යභාරයක් ඉටු කිරීම සම්බන්ධයෙන් සිය සතුට ප්‍රකාශ කළේය. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඉන්දියාව විසින් නිෂ්පාදනය කරන ලද එන්නත් මාත්‍රා 500,000 පෞද්ගලිකව පැමිණ භාරගත් බව ද එතුමා සිහිපත් කළේය. වසංගතයට එක්ව මුහුණ දීම වෙනුවෙන් ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පවතින ශක්තිමත් සහයෝගිතාවය ඉදිරියටත් අඛණ්ඩව පවත්වාගෙන යන බව එතුමා අවධාරණය කළේය.

2. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පොදු ප්‍රජාතාන්ත්‍රිය අගයන් සහ සම්ප්‍රදායන් පවතින බව ප්‍රකාශ කළ එතුමා සේවා සම්බන්ධයෙන් ඉන්දියාවේ ශක්‍යතාවයන් ශ්‍රී ලංකාව වෙනුවෙන් සහ ජනතාව විසින් තෝරාපත් කර ගන්නා ලද නියෝජිතයන් වෙනුවෙන් ලබා දීම ඉන්දියාවට ගෞරවයක් බව සඳහන් කළේය.

3. ඉන්දියාව විසින් ප්‍රදානය කරන ලද එන්නත නාරහේන්පිට හමුදා රෝහලේදී ගරු කතානායකතුමා ට ලබා දීමේ අවස්ථාවට මහ කොමසාරිස්තුමා ද එක් විය. යුධ හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මැතිතුමා ද මේ අවස්ථාවට සහභාගී විය.

4. 'අසල්වැසියා ප්‍රථමයෙන්' සහ SAGAR යන ප්‍රතිපත්තීන්ට අනුව ඉන්දියාව 2021 ජනවාරි 20 වන දින සිට කොවිඩ්-19 එන්නත් මිලියන ගණනක් අසල්වැසි රටවලට මෙන්ම ගල්ෆ් කලාපයේ සහ ඉන්දියානු සාගරයේ රටවලට ප්‍රදානය කර

ඇත. මෙයට අමතරව, තවත් එන්නත් මාත්‍රා මිලියන ගණනක් ලතින් ඇමරිකානු , කැරිබියානු සහ පැසිෆික් රටවල් ඇතුළු රටවල් රැසකට අපනයනය කර ඇත.

***

***කොළඹ***
***2021 පෙබරවාරි 17***